...MF 35

ඔබේ අංකය
உமது இல.
Your No. } ..............................

දුරකථනය (දු. සා.)
தொலைபேசி (பொ. மு.)
Telephone (G. M. R.) } 2431177

E-mail : gmrslr@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office } 2421281

ෆැක්ස්
தொலைநகல்
Fax } 2446490


# ශ්‍රී ලංකා දුම්රිය සේවය
# இலங்கை புகையிரத சேவை
# SRI LANKA RAILWAYS


මගේ අංකය
எனது இல.
My No. } දුම්/වාණි/ජනමාධ්‍ය/නිවේදන/2016

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ. පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர் அலுவலகம்,
த. பெ. 355, ஒல்கொட் மாவத்தை,
கொழும்பு 10.

General Manager's Office,
P. O. Box 355, Olcott Mawatha,
Colombo 10.


2020.07.03

සියළුම ජනමාධ්‍ය වෙත.

<u>කොරෝනා උවදුර නිසා දුම්රිය ධාවනය නොවූ කාලයට අදාලව ලබාගත් වෙන්කල ආසන ප්‍රවේශපත්‍ර සම්බන්ධව කටයුතු කිරීම.</u>

කොරෝනා උවදුර හේතුවෙන් ධාවනය නොවූ දුම්රියන් සඳහා දුම්රිය බලපත්‍ර හෝ මුදල් මත හෝ ආසන වෙන්කරවා ගත් ප්‍රවේශපත්‍ර සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු සිදුකිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් තීරණය කර ඇත.

01. දුම්රිය බලපත්‍ර මත නිකුත්කර ඇති වෙන්කළ ආසන ප්‍රවේශපත්‍ර ගාස්තු අය කිරීමකින් තොරව නව ආසන වෙන් කිරීමක් සහිත ප්‍රවේශපත්‍රයක් නිකුත්කරනු ඇත.

02. මුදල් සඳහා නිකුත්කර ඇති වෙන්කළ ආසන ප්‍රවේශපත්‍ර වෙනුවෙන් එම ප්‍රවේශපත්‍රයේ වටිනාකමට සමාන හෝ ඊට වැඩි දුම්රිය ගමනක් සඳහා මගීන්ගේ ඉල්ලීම පරිදි වෙන්කළ ආසන ප්‍රවේශපත්‍රයක් ලබා දෙනු ඇත.මෙහිදී ගාස්තුවෙහි වෙනසක් පවතිනම් මගියා එම හිඟ මුදල පියවිය යුතුය.

03. මෙම පහසුකම ලබාගැනීමට මුල් ප්‍රවේශපත්‍රයේ සඳහන් මගීන්ම හිලව්ගමන සඳහාද සහභාගිවිය යුතුය.

04. හිලව් ගමන සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම ආරම්භ වීමෙන් පසුව පමණක් (ගමනට දින 30ට පෙර සිට) නව ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ.

05. හිලව් ගමන 2020.12.31 දිනට පෙර සිදු කළ යුතුය.

06. ඉහත අවස්ථාව ප්‍රයෝජනයටගත නොහැකි යම් මගියෙකු මිලදී ගත් ප්‍රවේශපත්‍ර සඳහා ප්‍රවේශපත්‍ර ගාස්තු ආපසු ලබාගැනීමට අදාල දුම්රිය ස්ථාන වෙත නියමිත ආකෘතියට අනුව ඉල්ලීමක් ලබාදිය යුතුය.

මේ සම්බන්ධව ඔබගේ මාධ්‍ය මගින් මහජනතාව දැනුවත්කරන ලෙස ඉල්ලා සිටිමි.

අධිකාරි(වාණිජ)

ඩී.ඕ.එස්. බණ්ඩාර චන්ද්‍රසේන
අධිකාරි (වාණිජ)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) කාර්යාලය
දුම්රිය මූලස්ථානය
කොළඹ 10.